# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
# කළමනාකරණ අධ්‍යයන පීඨය

## කළමනාකරණ අධ්‍යයන ගෞරව උපාධිය
## **AFU 3571 – මූල්‍ය ගිණුම්කරණය**
## අවසාන විභාගය - **2024/2025**
## කාලය - පැය තුනයි (03)

*දිනය : 2025 ජුනි 29* *වේලාව : පෙ.ව 9.30 – ප.ව. 12.30*

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකම අවසානයේ ලකුණු සඳහන් කර ඇත.
- කරුණාකර පිළිතුරු පොතේ සපයා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය පැහැදිලිව ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රිත පිටු පහකින් (05) සමන්විත වේ.
- සියලුම ප්‍රශ්න අංක පැහැදිලිව සඳහන් කළ යුතුය.
- වැඩසටහන්ගත කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතා කිරීමට අවසර ඇත.

**ප්‍රශ්න අංකය 01**

I) අර්වින් ට්‍රේඩර්ස් යනු තනි පුද්ගල ව්‍යාපාරිකයෙකි. **2025.03.31** දිනට අර්වින් ට්‍රේඩර්ස් හි ගිණුම් පොත්වලින් උපුටා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

අර්වින් ට්‍රේඩර්ස්
2025 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම (රු.'000)

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ගැණුම් සහ විකුණුම් | 13,000 | 35,000 |
| දේපල පිරියත සහ උපකරණ - පිරිවැයට | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 2,000 | |
| යන්ත්‍ර | 1,000 | |
| ගෘහ භාණ්ඩ | 1,000 | |
| පරිගණක | 1,500 | |
| බෙදාහැරීමේ ලොරිය | 2,000 | |
| **2024 අප්‍රේල් 01 වන දිනට සමුච්චිත ක්ෂයවීම්** | | |
| ගොඩනැගිලි | | 200 |
| යන්ත්‍ර | | 100 |
| ගෘහ භාණ්ඩ | | 120 |
| පරිගණක | | 130 |
| බෙදාහැරීමේ ලොරිය | | 200 |
| ණය ගැතියෝ සහ ණය හිමියෝ | 12,000 | 11,000 |
| 2024 අප්‍රේල් 01 වන දිනට තොගය | 7,000 | |

| | | |
|---|---|---|
| 2024 අප්‍රේල් 01 වන දිනට අඩමාන ණය සඳහා වෙන්කිරීම් | | 150 |
| 2024 අප්‍රේල් 01 වන දිනට ප්‍රාග්ධනය | | 20,700 |
| 5% ස්ථාවර තැන්පතු | 5,000 | |
| කාර්ය මණ්ඩල වැටුප් | 3,900 | |
| 12% බැංකු ණය | | 10,000 |
| විදුලි ගාස්තු | 600 | |
| බැංකු ඇති මුදල් | 3,000 | |
| 5% දිගුකාලීන ආයෝජනය | 10,000 | |
| පිරිසිදු කිරීමේ වියදම් | 1,500 | |
| කුලී ආදායම | | 1,500 |
| අතැති මුදල් | 16,500 | |
| කොමිස් ආදායම | | 500 |
| ආයෝජන ආදායම | | 400 |
| | **80,000** | **80,000** |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

1) 2025/03/31 දිනට අවසන් තොගය රු. 5,750,000 ක් ලෙස අගය කරන ලදී. මෙම තොගයේ ශුද්ධ උපලබ්ධි වටිනාකම රු. 5,500,000 කි.
2) වත්මන් ගිණුම්කරණ වර්ෂය සඳහා ලැබිය යුතු කොමිස් ආදායම රු. 100,000 කි.
3) සෑම මසකම කුලී ආදායම රු. 120,000 කි. ඉතිරි කුලී ආදායම ඊළඟ ගිණුම්කරණ කාලය සඳහා ලැබී ඇත.
4) ව්‍යාපාරය විසින් ගෙවන ලද විදුලි ගාස්තු වලින් 50% ක් පමණක් වත්මන් ගිණුම්කරණ කාලයට අයත් වේ.
5) 2025 මාර්තු මාසය සඳහා පිරිසිදු කිරීමේ වියදම් රු. 50,000 තවමත් ගෙවා නොමැත.
6) ව්‍යාපාරය 2024/07/01 දින ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත.
7) දේපල පිරියත සහ උපකරණ පිරිවැය අනුව සරල රේඛීය පදනම මත ක්ෂය කළ යුතුය.
    - ගොඩනැගිලි : 10% (ඉඩමේ වටිනාකම රු. 1,500,000 කි.)
    - යන්ත්‍ර : 05%
    - ගෘහ භාණ්ඩ : 10%
    - බෙදාහැරීමේ ලොරිය : 10%
    - පරිගණක : 05%
8) ණයගැතියෙකුගෙන් බොල් ණය ලෙස රු. 100,000/- ක් කපා හැරීමටත්, 2025 මාර්තු 31 වන දිනට ඉතිරි ශේෂය මත අඩමාණ ණය සඳහා 5% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් කිරීමටත් හිමිකරු තීරණය කළේය.
9) බැංකු ණය 2024/01/10 දින ලබා ගෙන ඇත.
10) දිගුකාලීන ආයෝජනය 2024/04/01 දින සිදු කර ඇත.

ඔබ පහත සඳහන් දෑ සකස් කළ යුතුය:

i) 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.
ii) 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

**(ලකුණු 40)**

ප්‍රශ්න අංකය 02

I. වඩාත් හොඳ මූල්‍ය ගිණුම්කරණ තොරතුරු වල ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. 2025 අප්‍රේල් මාසය සඳහා සිල්ලර ව්‍යාපාරයක් වන රොකී එන්ටර්ප්‍රයිසස් හි ගිණුම් පොත්වලින් පහත ගනුදෙනු උපුටා ගෙන ඇත.

1. සනී මහතා රු. 2,000,000 ක් මුදලින් ද, රු. 300,000 ක් වටිනා උපකරණ ද, රු. 400,000 ක් වටිනා තොගයක ද ආයෝජනය කිරීමෙන් ව්‍යාපාරයක් ආරම්භ කළේය.
2. ව්‍යාපාරය රු. 250,000 ක් වටිනා කාර්යාල ගෘහ භාණ්ඩ මුදලට මිලදී ගන්නා ලදී.
3. ග්ලෝබල් නැමැති සැපයුම්කරුගෙන් රු. 500,000 ක් වටිනා තොගයක් ණයට මිලදී ගන්නා ලදී.
4. නිමල් මහතාට රු. 200,000 ක් වටිනා තොගයක් රු. 280,000 කට ණයට විකුණන ලදී.
5. වෙළඳ දැන්වීම් වියදම් සඳහා රු. 100,000 ක් මුදලින් ගෙවන ලදී.
6. හානියට පත් රු. 50,000 ක් වටිනා තොග ග්ලෝබල් සැපයුම්කරුවන්ට ආපසු ලබා දෙන ලදී.
7. සනී මහතා ව්‍යාපාරයට රු. 300,000 ක අමතර ප්‍රාග්ධනයක් මුදල් වශයෙන් ලබා දෙන ලදී.
8. ග්ලෝබල් සැපයුම්කරුවන්ට රු.400,000 ක් ගෙවන ලද අතර ගෙවීම සඳහා වට්ටමක් ලැබුණි.
9. සනී මහතා පුද්ගලික භාවිතය සඳහා ව්‍යාපාරයෙන් රු.75,000 ක් ලබා ගත්තේය.
10. නිමල් මහතා රු. 250,000 ක මුදලක් සම්පූර්ණ ණය පියවීමක් වශයෙන් ලබා දුන් අතර, ඒ සඳහා රු. 30,000 ක වට්ටමක් ලබා දෙන ලදී.
11. සේවකයින්ට රු. 120,000 ක වැටුප් ගෙවීය.
12. රු. 1,800,000 කට නව බෙදාහැරීමේ වෑන් රථයක් ශාන් ඔටෝ මොබයිල් වෙතින් මිලදී ගන්නා ලද අතර ඒ සඳහා රු. 500,000 ක් මුදල් වශයෙන් ද ඉතිරිය ණය ලෙස ද සටහන් කරන ලදී.
13. විදුලිය සහ ජල වියදම් සඳහා රු. 25,000 ක් ගෙවන ලදී.
14. ව්‍යාපාරික මුදල් වලින් රු. 200,000 ක් ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කරන ලදී.
15. කුලී ආදායමක් ලෙස රු. 90,000 ක් මුදලින් ලැබිණි.

ඔබට අවශ්‍ය වන්නේ;

මෙම ගනුදෙනු <u>මූලික ගිණුම්කරණ සමීකරණයට</u> ඇතුළත් කරන්න.

(ලකුණු 15)

**(ලකුණු 20)**

ප්‍රශ්න අංකය 03

I. නිෂ්පාදන ව්‍යාපාරයක් වන සෑම් නිෂ්පාදකයින්ගෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

- භාවිතා කරන ලද සෘජු ද්‍රව්‍ය : රු. 120,000
- සෘජු ශ්‍රමය : රු. 80,000
- කර්මාන්තශාලා කුලිය : රු. 25,000
- කාර්යාල වැටුප් : රු. 15,000
- කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ ක්ෂයවීම් : රු. 10,000
- කර්මාන්තශාලා උපයෝගී බිල්පත් : රු. 5,000

අවශ්‍ය වන්නේ,

අ) ප්‍රාථමික පිරිවැය
ආ) මුළු නිෂ්පාදන පිරිවැය

(ලකුණු 08)

II. ක්‍රිස්ටල් වෝටර්ස් ලිමිටඩ් හි මුදල් පොතේ 2025 මැයි 31 වන දිනට රු. 84,200 ක හර ශේෂයක් පෙන්නුම් කරන ලදී. මුදල් පොත බැංකු ප්‍රකාශනය සමඟ සංසන්දනය කිරීමේදී පහත වැරදි සොයා ගන්නා ලදී.

1. රු. 2,250 ක බැංකු ගාස්තු බැංකු ප්‍රකාශනයේ ඇතුළත් කර ඇති නමුත් තවමත් මුදල් පොතේ සටහන් කර නොමැත.
2. රක්ෂණ වාරිකයට අදාළව රු. 5,000 ක ස්ථාවර නියෝගයක් බැංකුව විසින් මැයි 25 වන දින සිදු කරන ලද නමුත් මුදල් පොතේ කිසිදු සටහනක් නොපෙන්වයි.
3. ගනුදෙනුකරුවෙකුගෙන් ලද රු. 18,000 ක සෘජු බැර කිරීමක් මැයි 30 වන දින බැංකු ප්‍රකාශනයේ පමණක් සටහන් කර ඇත.
4. මැයි 28 වන දින නිකුත් කරන ලද රු. 9,500 ක චෙක්පතක් (චෙක්පත් අංක 1120) මැයි 31 වන දින වන විටත් ගෙවීම සඳහා ඉදිරිපත් කර නොමැත.
5. මැයි 30 වන දින සිදු කරන ලද රු. 11,200 ක චෙක්පත් (චෙක්පත් අංක 3110) තැන්පතුවක් මැයි 31 වන දින වන විටත් බැංකුව විසින් බැර කර නොතිබුණි.
6. ගනුදෙනුකරුවෙකුගෙන් ලැබුණු රු. 3,000 ක චෙක්පතක් අගරු වී ඇති අතර එය බැංකු ප්‍රකාශනයේ මැයි 29 වන දින හර කර ඇති නමුත්, ඒ සඳහා මුදල් පොතේ කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.
7. රු. 1,800 ක බැංකු පොලී ආදායමක් මැයි 31 වන දින බැංකුව විසින් බැර කරන ලද අතර එය බැංකු ප්‍රකාශයෙන් සොයා ගන්නා ලදී.
8. චෙක් පොත් ගාස්තු රු.1,000 ක් බැංකු ප්‍රකාශයෙන් හඳුනාගෙන ඇත.
9. සැපයුම්කරුවෙකුට නිකුත් කරන ලද රු. 4,600 ක චෙක්පතක්, මුදල් පොතේ රු. 6,400 ක් ලෙස සටහන් කර ඇත.
10. වෙනත් ගනුදෙනුකරුවෙකු සඳහා සිදු කරන ලද ගනුදෙනුවක්, බැංකුව විසින් ක්‍රිස්ටල් වෝටර්ස් ලිමිටඩ් ගිණුමේ රු. 2,800 ක් වැරදි ලෙස හර කර ඇත.

ඔබ පහත සඳහන් දෑ සකස් කළ යුතුය:

අ) 2025 මැයි 31 වන දිනට සංශෝධිත මුදල් පොත.
ආ) 2025 මැයි 31 වන දිනට සංශෝධනය කරන ලද මුදල් පොත් ශේෂයෙන් ආරම්භ වන පරිදි බැංකු සැසඳුම් ප්‍රකාශය සකස් කරන්න.

(ලකුණු 12)
**(ලකුණු 20)**

**ප්‍රශ්න අංකය 04**

I) ට්‍රෙවින් බේකර්ස් හි ශේෂ පිරික්සුමේ ශේෂය එකඟ නොවූ අතර රු. 6,500 ක වෙනස අවිනිශ්චිත ගිණුමට හර කරන ලදී. විමර්ශනයේදී පහත දෝෂ සොයා ගන්නා ලදී.

1. ගැණුම් ගිණුම රු. 4,000 කින් වැඩියෙන් සටහන් කර ඇත.
2. රු. 200,000 කට මිලදී ගත් මෝටර් රථයක් ගැණුම් ගිණුමට වැරදි ලෙස හර කරන ලදී.
3. ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 25,000 ක් ඔහුගේ ගිණුමට රු. 2,500 ක් ලෙස බැර කරන ලදී.
4. රු. 18,000 ක විකිණීමක් රු. 81,000 ක් ලෙස විකුණුම් ගිණුමේ සටහන් කර ඇත.
5. රු. 6,000 ක් ගෙවන ලද කුලිය වැටුප් ගිණුමට හර කරන ලදී.

6. රු. 15,000 ක මුදලට විකුණුම් සම්පූර්ණයෙන්ම පොත් වලින් මග හැරී ඇත.
7. පිරිසිදු කිරීමේ වියදම් සඳහා ගෙවන ලද රු. 1,200 ක් ලිපි ද්‍රව්‍ය ගිණුමට හර කරන ලදී.
8. මුදල් පොතේ ලද වට්ටම් තීරුවේ එකතුව රු. 500 කින් අඩුවෙන් සටහන් කර ඇත.
9. රු. 22,000 ක ණයට මිලදී ගැනීමක් මිලදී ගැණුම් ජ(ර්)නලයේ නිවැරදිව සටහන් කර ඇති නමුත් සැපයුම්කරුගේ ගිණුමට සටහන් කර නොමැත.
10. අලුත්වැඩියා වියදම සඳහා රු. 8,000 ක ගෙවීමක් ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මග හැරී ඇත.
11. වෙළඳ දැන්වීම් සඳහා ගෙවන ලද රු. 3,500 ක්, වැරදි ලෙස විකුණුම් ගිණුමට බැර කර ඇත.
12. ගනුදෙනුකරුවෙකුගෙන් ලද රු. 12,000 ක රිසිට්පතක් මුදල් පොතේ දෙවරක් ඇතුළත් කර ඇත.
13. රු. 7,000 ක ආපසු යැවුම්, ආපසු යැවුම් ගිණුමේ සටහන් කර නොමැත.
14. මුදලින් ගෙවන ලද රු. 9,000 ක වැටුප් මුදල් පොතේ පමණක් සටහන් කර ඇති නමුත් වැටුප් ගිණුමේ සටහන් කර නොමැත.
15. ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 5,500 චෙක්පතක් මුදල් පොතේ සටහන් කර ඇති නමුත්, ණයගැතියාගේ ගිණුමේ සටහන් කර නොමැත.

ඔබට අවශ්‍ය වන්නේ:

අ) අවිනිශ්චිත ගිණුම

ආ) වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන්

**(ලකුණු 20)**

**(ලකුණු 100)**

*- සියලු හිමිකම් ඇවිරිණි -*